100

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන 2022/2023

5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2023

SNE5247/ESE5147-අන්තර්කරණ පන්තිකාමරවල ළමයින්ගේ ගැටළු සමඟ කටයුතු කිරීම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.11.11 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද , 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "ශ්‍රී ලංකාවේ දුබලතා පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුව අවුරුදු 5 ත් 16 ත් අතර සියලුම දරුවන්ට අනිවාර්ය අධ්‍යාපන ආඥාපනත අදාළ විය යුතුය. තවමත් ප්‍රායෝගිකව පාසල් ආරම්භ නොකරන හෝ පාසල් නොයන දුබලතා සහිත දරුවන් ගණනාවක් සිටිති.

    පාසල් නොයන ළමුන් වර්ග පහක් (05) ලැයිස්තුගත කරන්න.

02. විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ඔවුන්ගේ දෙමාපිය මැදිහත් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ පහක් (05) සඳහන් කරන්න.

03. 'අවම බාධා සහිත පරිසරය' උදාහරණයක් සමඟ පැහැදිලි කරන්න.

04. වඩාත් ඵලදායී අන්තර්කරණ පන්තිකාමර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ගුරුවරුන්ට ක්‍රියාත්මක කළ හැකි උපාය මාර්ග පහක් (05) නම් කරන්න.

05. ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සිටින දෙමාපියන්හට, තම දරුවන් පාසල් තුළ ස්ථානගත කිරීම සම්බන්ධයෙන් මුහුණ දෙන ගැටලු තුනක් (03) විස්තර කරන්න.

06. දුබලතා සහිත සහ දුබලතා රහිත ළමුන් සඳහා අන්තර්කරණ පන්තිකාමරවල ප්‍රතිලාභ කෙටියෙන් පැහැදිලි කරන්න.

07. පුද්ගලානුබද්ධ අධ්‍යාපන සැලසුම (IEP) කණ්ඩායමකට අත්‍යවශ්‍ය සාමාජිකයන් පස් දෙනෙක් (05) නම් කරන්න.

08. අන්තර්කරණ පන්තිකාමරයක සම-ඉගැන්වීමේ ප්‍රතිලාභ පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. "ගුණාත්මක අන්තර්කරණ අධ්‍යාපනය වැඩි අන්තර්කරණ සමාජ සඳහා මගපාදයි."

i. උදාහරණ තුනක් (03) සමගින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ ගුණාත්මක අන්තර්කරණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 08)

iii. ඉහත යෝජනා ක්‍රියාත්මක කිරීමේ දී පාර්ශ්වකරුවන් මුහුණ දෙන අභියෝග දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 04)

10. "දරුවන්ගේ අධ්‍යාපනයට සම්බන්ධවීමට දෙමාපියන්ට අයිතියක් ඇත."

i. "දෙමාපිය සහායක කණ්ඩායම්" (Parental Support Group) ඔබේ වචනවලින් නිර්වචනය කර දෙමාපිය සහාය කණ්ඩායම්වල වාසි තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

ii. පාසල සමඟ ඵලදායී හවුල්කාරිත්වයක් ගොඩනඟා ගැනීමට අවශ්‍ය දෙමාපියන්ගේ අයිතිවාසිකම් පහක් (05) ලැයිස්තුගත කර, ඒවායින් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

iii. "දෙමාපිය සහායක කණ්ඩායම්" (Parental Support Group) එකිනෙකාගෙන් ඉගෙන ගන්නා ආකාරය කෙසේදැයි අගයන්න. (ලකුණු 08)

11. i. පන්තිකාමරයේ දී ඔබට හමු වූ ඔටිසම් සහිත දරුවෙකුගේ ගති ලක්ෂණ තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. අන්තර්කරණ පන්තිකාමරය තුළ ඉහත ශිෂ්‍යයා සමඟ ඔබ මුහුණ දෙන අභියෝග හතරක් (04) ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

iii. අන්තර්කරණ පන්තිකාමරයක ගුරුවරයෙකු ලෙස ඉහත අභියෝග ජය ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

12. ඔබ හැසිරීමේ ගැටළු සහිත දරුවෙකුගේ දෙමාපියෙකු යයි සිතන්න.

i. ඉහත එම දරුවාගේ අභියෝගාත්මක හැසිරීම් පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 05)

ii. මෙම දරුවාගේ හැසිරීම් ගැටළු හේතුවෙන් අන්තර්කරණ පන්තිකාමරයක අනෙකුත් සිසුන් මුහුණ දෙන ගැටළු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 07)

iii. ගුරුවරයෙකුට පන්තිකාමරය තුළ සමවයස් සමාජ අන්තර්ක්‍රියා සංවිධානය කරන්නේ කෙසේදැයි උදාහරණ සහිතව තාර්කිකව ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

13. i. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුවෙකු ඔහුගේ නිවසට ළඟම ඇති පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේ දී එහි විදුහල්පති මුහුණ දෙන ගැටලු **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

ii. ශ්‍රී ලංකාවේ පාසල්වල අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමට ඇති බාධක **පහක් (05)** විස්තර කරන්න. (ලකුණු 07)

iii. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ නිවසට ආසන්න සාමාන්‍ය පාසල්වලට, ඇතුළත් කර ගැනීමේ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා සිදුකළ හැකි අතිරේක විධිවිධාන **තුනක් (03)** තාර්කිකව ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

14. "ශ්‍රී ලංකාව තුළ අන්තර්කරණ අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත කළ යුතුය."

i. ඉහත ප්‍රකාශය සඳහා ඔබේ දෘෂ්ටි කෝණය ඇසුරෙන් තාර්කිකව ඉදිරිපත් කරන්න. (ලකුණු 06)

ii. ශ්‍රී ලංකාවේ අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඔබේ යෝජනා දක්වන්න. (ලකුණු 06)

iii. අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් ඇති කිරීමේ ක්‍රියාවලියක් අනුගමනය කිරීම සඳහා, පාර්ශ්වකරුවන් ඇතුළත්කර ගැනීමේ වැදගත්කම අගයන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.